# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2262/34 - 2022 ජනවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

බැසිල් රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2022 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි "**2022 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. මෙම රෙගුලාසි 2022 ජනවාරි මස 13 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

3. සංශෝධිත 2017 නොවැම්බර් මස 09 දිනැති අංක 2044/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල අංක 1 දරන උපලේඛනයේ අනුක්‍රමික අංක 17 යටතේ විස්තර කර ඇති පහත සඳහන් අයිතම සහ ඒවාට අනුරූපී සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ.

1A - PG 5714 — 460 (2022/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ | II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව විස්තරය | IV තීරුව ආනයන පාලන බලපත්‍ර (L) |
|---|---|---|---|---|---|
| 17 | 05.11 | | | **අන් තැනක නිශ්චිත නොවූ හෝ ඇතුළත් නොවූ සත්ත්ව නිෂ්පාදන ; මනුෂ්‍ය ආහාරයට නුසුදුසු, 1 වන හෝ 3 වන පරිච්ඡේදයේ මළ සතුන්.** | |
| | | 0511.10.00 | - | ගවාදී සතුන්ගේ ශුක්‍ර ධාතු | L |
| | | 0511.99.20 | --- | ඌරන්ගේ ශුක්‍ර ධාතු | L |
| | | 0511.99.30 | --- | එළුවන්ගේ ශුක්‍ර ධාතු | L |

4. රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින්, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0511.10.00, 0511.99.20 සහ 0511.99.30 යටතේ විස්තර කර ඇති භාණ්ඩ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු සත්ත්ව නිරෝධායන සහතිකයක් ඉදිරිපත් කිරීම මත නිදහස් කළ යුතු ය.

EOG 01 - 0182

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.